සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

70258



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

**33 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : .................................

උපදෙස්:

- ✻ අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- ✻ අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- ✻ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.
- ✻ **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 1 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති / ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

1. පහත දක්වෙන කුමන ප්‍රකාශයෙන් ආයතනයක මූල්‍ය ගණකාධිකරණයේ කාර්යභාරය **වඩාත්** හොඳින් විස්තර කරනු ලබයි ද?
   (1) එය ආයතනයක ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තා කරයි.
   (2) එය ආයතනයක ගනුදෙනු මූල්‍ය තොරතුරුවලට පරිවර්තනය කරයි.
   (3) එය ආයතනයක වාර්ෂික විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.
   (4) එය ආයතනයක සැලසුම් කිරීම සහ පාලනය සඳහා කළමනාකරුවන්ට තොරතුරු සපයයි.
   (5) එය ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන බාහිර පාර්ශ්වයන්ට සහ එහි කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සපයයි. (.........)

2. ගිණුම්කරණ සමීකරණයේ මූලිකාංගයක් ලෙස හිමිකම වෙන ම හඳුනාගැනීම අවශ්‍ය වන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයට අනුව ද?
   (1) ඒකක (2) උපචිත (3) අඛණ්ඩ පැවැත්ම
   (4) ගැලපුම් (5) කාලච්ඡේද (.........)

3. ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල වගකීම් සහතික මත ප්‍රතිපාදනයක් කිරීමට අදාළ වන්නේ පහත සඳහන් කුමන ගිණුම්කරණ සංකල්පය / සංකල්ප ද?
   A - උපචිත B - ගැලපුම් C - ආරක්ෂණ
   (1) B පමණි (2) A හා B පමණි (3) A හා C පමණි
   (4) B හා C පමණි (5) A, B හා C යන සියල්ල ම (.........)

4. 2012.04.01 දින අමල් ඔහුගේ පෞද්ගලික ඉතුරුම් රු. 500 000 ක් සහ ඔහුගේ රු. 2 000 000 ක් වටිනා මෝටර් රථය යොදවමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. පළමු මෙහෙයුම් මාසය තුළ දී ව්‍යාපාරය රු. 300 000 ක භාණ්ඩ ණයට මිල දී ගත් අතර එයින් රු. 50 000 ක් වටිනා භාණ්ඩ දෝෂ සහිත වීම නිසා ආපසු යවන ලදී. මෙම ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලාශ්‍ර ලියවිලිවල අනුපිළිවෙළ වන්නේ:
   (1) ජර්නල් වවුචරය, ඉන්වොයිසිය, හරපත.
   (2) ජර්නල් වවුචරය, ඉන්වොයිසිය, බැරපත.
   (3) ලදුපත, ඉන්වොයිසිය, බැරපත.
   (4) වාහන ලියාපදිංචි පොත, ඉන්වොයිසිය, බැරපත.
   (5) වාහන ලියාපදිංචි පොත, ඉන්වොයිසිය, හරපත. (.........)

5. ව්‍යාපාර ආයතනයක් විසින් 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව ලකුණු කළ මිල රු. 200 000 ක් වූ භාණ්ඩ ණය පදනම මත මිල දී ගන්නා ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපණය කරනුයේ:

| | වත්කම් | වගකීම් | හිමිකම |
|---|---|---|---|
| (1) | රු. 180 000 කින් වැඩි වේ. | රු. 180 000 කින් වැඩි වේ. | - |
| (2) | රු. 200 000 කින් වැඩි වේ. | රු. 200 000 කින් වැඩි වේ. | - |
| (3) | රු. 180 000 කින් වැඩි වේ. | රු. 200 000 කින් වැඩි වේ. | රු. 20 000 කින් අඩු වේ. |
| (4) | රු. 200 000 කින් වැඩි වේ. | රු. 180 000 කින් වැඩි වේ. | රු. 20 000 කින් වැඩි වේ. |
| (5) | රු. 200 000 කින් වැඩි වේ. | රු. 220 000 කින් වැඩි වේ. | රු. 20 000 කින් අඩු වේ. |

(.........)

[ දෙවෙනි පිටුව බලන්න.

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

6. පහත තොරතුරු 2013 මාර්තු මාසය සඳහා ව්‍යාපාරයකට අදාළ වේ.

| විකුණුම් | ලකුණු කළ මිල (රු.'000) | වෙළෙඳ වට්ටම් |
|---|---|---|
| මුදලට | 1 000 | 10% |
| ණයට | 4 000 | 5% |

විකුණුම් දින සිට දින 15ක් තුළ ගෙවිය යුතු මුදල පියවූ විට ණයගැතියන්ට 5% ක මුදල් වට්ටමක් දෙනු ලැබේ. ව්‍යාපාරයේ වාර්තාවලට අනුව ණයගැති ශේෂවලින් 50% ක් මෙම වට්ටම භාවිත කරමින් පියවා ඇත.

ණයගැතියන්ට දුන් වට්ටම් සටහන් කිරීම සඳහා නිවැරදි ජර්නල් සටහන වනුයේ:

| | හර (රු.) | | බැර (රු.) | |
|---|---|---|---|---|
| (1) | දුන් වට්ටම් ගිණුම | 95 000 | මුදල් ගිණුම | 95 000 |
| (2) | දුන් වට්ටම් ගිණුම | 95 000 | ණයගැති පාලන ගිණුම | 95 000 |
| (3) | දුන් වට්ටම් ගිණුම | 195 000 | මුදල් ගිණුම | 195 000 |
| (4) | දුන් වට්ටම් ගිණුම | 295 000 | ණයගැති පාලන ගිණුම | 295 000 |
| (5) | දුන් වට්ටම් ගිණුම | 395 000 | මුදල් ගිණුම | 395 000 |

(.........)

7. පහත සඳහන් කුමන ප්‍රකාශය ණයහිමි පාලන ගිණුමට අදාළව **නිවැරදි** වේ ද?
(1) සෑම ණයහිමියෙක් වෙනුවෙන් ම පාලන ගිණුමක් පවත්වාගෙන යයි.
(2) සියලු ම ගැනුම් ණයහිමි පාලන ගිණුමේ සටහන් කරයි.
(3) ගැනුම් ජර්නලයේ එකතුව ණයහිමි පාලන ගිණුමේ සටහන් කරයි.
(4) ණයහිමියන්ගෙන් ලද වට්ටම් ණයහිමි පාලන ගිණුමේ සටහන් නොකරයි.
(5) ණයහිමි පාලන ගිණුම ණයහිමි ලෙජරයේ පවත්වාගෙන යයි. (.........)

- **ප්‍රශ්න අංක 8 සහ 9 ට පිළිතුරු සැපයීමට ආයතනයකට අදාළ පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

2013 මාර්තු සහ පෙබරවාරි මාස තුළ දී තැන්පත් කළ චෙක්පත් හා නිකුත් කළ චෙක්පත්වල සාරාංශය පහත පරිදි වේ.

| විස්තරය | 2013 මාර්තු (රු. '000) | 2013 පෙබරවාරි (රු. '000) |
|---|---|---|
| බැංකුවේ තැන්පත් කළ චෙක්පත් | 1 000 | 900 |
| චෙක්පත් නිකුත් කිරීම | 750 | 600 |

පහත තොරතුරු ද දී ඇත:

| විස්තරය | 2013.03.31 දිනට (රු. '000) | 2013.02.28 දිනට (රු. '000) |
|---|---|---|
| චෙක්පත් තැන්පතු උපලබ්ධි වීම | 750 | 900 |
| ගෙවීම සඳහා ඉදිරිපත් කළ චෙක්පත් | 600 | 500 |
| බැංකුවට සෘජුව ලද පොලී ආදායම | - | 50 |
| බැංකු ගාස්තු | 10 | 5 |
| බැංකු ගිණුමේ ශේෂය (පොලී ආදායම හා බැංකු ගාස්තු ගැලපීමට පෙර) | 395 | 100 |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | ? | 245 |

පෙබරවාරි මාසය තුළ දී ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් මාර්තු මාසයේ දී ගෙවීමට ඉදිරිපත් කර ඇත.

8. 2013.02.28 දිනට බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය කොපමණ ද?
(1) රු. 145 000 (2) රු. 190 000 (3) රු. 200 000 (4) රු. 290 000 (5) රු. 345 000 (.........)

9. 2013.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය කොපමණ ද?
(1) රු. 245 000 (2) රු. 285 000 (3) රු. 295 000 (4) රු. 385 000 (5) රු. 395 000 (.........)

10. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවට අනුව පහත සඳහන් කුමන දෑ මූල්‍ය ප්‍රකාශනවල **මූලික ගුණාත්මක ගතිලක්ෂණ** ලෙස සලකනු ලබයි ද?

A - අදාළ බව B - තේරුම්ගත හැකි බව C - විචක්ෂණශීලී බව D - ප්‍රමාණාත්මක බව

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි.
(4) B හා C පමණි. (5) A, B, C හා D යන සියල්ල ම. (.........)

11. පහත සඳහන් තොරතුරු 2013.03.31 දිනෙන් අවසන් මාසය සඳහා සමාගමකට අදාළ වේ.

| විස්තරය | ඒකක | ඒකකයක මිල (රු.) |
|---|---|---|
| 2013.03.01 දිනට තොගය | 1 000 | 100 |
| 2013.03.07 දින ගැනුම් | 5 000 | 120 |
| 2013.03.15 දින ගැනුම් | 3 000 | 140 |
| 2013.03.20 දින විකුණුම් | 8 000 | - |

තොග නිකුත් කිරීම, මිල කිරීම සඳහා සමාගම 'පෙර–ඇතුළු පෙර–පිට' ක්‍රමය භාවිත කරයි. වර්ෂය අවසාන තොගයේ ඒකකයක ශුද්ධ උපලබ්ධි අගය රු. 120 කි. සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කළ යුතු 2013.03.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් පිරිවැය සහ 2013.03.31 දිනට තොගයේ අගය කොපමණ ද?

| | 2013.03.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් පිරිවැය (රු.) | 2013.03.31 දිනට තොගය (රු.) |
|---|---|---|
| (1) | 960 000 | 120 000 |
| (2) | 980 000 | 140 000 |
| (3) | 980 000 | 120 000 |
| (4) | 1 020 000 | 100 000 |
| (5) | 1 020 000 | 120 000 |

(.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

paperhub.lk

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

12. සමාගමක් විසින් 2012.10.01 දින අවන්හලක් ඉදි කිරීම සඳහා ඉඩමක් අත්පත් කර ගන්නා ලදී. මීට අදාළව පහත පිරිවැය දරන ලදී.

| | රු.'000 |
|---|---|
| ඉඩමේ ගැනුම් මිල | 4000 |
| මුද්දර ගාස්තු සහ නීති ගාස්තු | 200 |
| ඉඩමේ පිහිටි පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරීමේ පිරිවැය | 200 |
| ඉදිකිරීම් සඳහා ඉඩම සකස් කිරීමේ පිරිවැය | 250 |
| ඉඩමේ වාර්ෂික නඩත්තු පිරිවැය | 100 |

තව ද, පැරණි ගොඩනැගිල්ලෙහි ඉවත් කරන ලද ද්‍රව්‍ය රු. 50000 කට විකුණන ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට (දේපළ, පිරියත සහ උපකරණ) අනුව 2013.03.31 දිනට ඉඩමේ පිරිවැය කොපමණ ද?

(1) රු. 4400000 (2) රු. 4450000 (3) රු. 4550000 (4) රු. 4600000 (5) රු. 4700000 (.........)

13. පහත දී ඇති තොරතුරු 2013 මාර්තු මාසය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයකට අදළ වේ.

| | රු.'000 |
|---|---|
| නොනිමි තොග වැඩි වීම (ප්‍රාථමික පිරිවැයට අගය කරන ලද) | 300 |
| නිමි තොග අඩු වීම | 100 |
| පරිභෝජනය කළ සෘජු අමුද්‍රව්‍ය | 300 |
| සෘජු ශ්‍රමය | 200 |
| කම්හල් පොදු කාර්යය පිරිවැය | 200 |

2013 මාර්තු මාසය සඳහා ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය සහ විකුණුම් පිරිවැය කොපමණ ද?

| | ප්‍රාථමික පිරිවැය (රු.) | විකුණුම් පිරිවැය (රු.) |
|---|---|---|
| (1) | 200000 | 300000 |
| (2) | 200000 | 500000 |
| (3) | 800000 | 900000 |
| (4) | 800000 | 1100000 |
| (5) | 1000000 | 900000 |

(.........)

14. 2013.03.31 දිනට සමාගමක පැවති තොගය ගංවතුර හේතුවෙන් සම්පූර්ණයෙන් ම විනාශ විය. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| 2012.04.01 දිනට තොගය | 1500 |
| ගැනුම් | 3500 |
| ආපසු යැවුම් | 500 |
| විකුණුම් | 4800 |
| විකුණුම් වියදම් | 600 |

පිරිවැය මත 20% ක ලාභ අනුපාතිකයක් පවත්වා ගනිමින් භාණ්ඩ විකිණීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

2013.03.31 දිනට විනාශ වූ තොගයේ අගය කොපමණ ද?

(1) රු. 500000 (2) රු. 660000 (3) රු. 750000 (4) රු. 1160000 (5) රු. 1500000 (.........)

15. හවුල්කරුවකු විසින් හවුල් ව්‍යාපාරයට ලබා දෙන ලද ණයක් සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය **නිවැරදි** වේ ද?

A - වෙනත් ආකාරයකට එකඟ වී නොමැති විට වාර්ෂිකව 5% ක පොලියකට හවුල්කරු හිමිකම් ලබයි.
B - ණය මුදල හවුල් ව්‍යාපාරයේ හිමිකමේ කොටසක් ලෙස සලකනු ලබයි.
C - හවුල්කරුවන්ට ලාභඅලාභ විසර්ජනය කිරීමේ දී ණය පොලී ගලපනු ලබයි.

(1) A පමණි (2) A හා B පමණි (3) A හා C පමණි
(4) B හා C පමණි (5) A, B හා C යන සියල්ල ම (.........)

● **ප්‍රශ්න අංක 16, 17 සහ 18 ට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු භාවිත කරන්න.**

භානුක සහ හේමක පිළිවෙළින් රු. 3000000 ක් සහ රු. 4000000 ක් ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් හවුල් ව්‍යාපාරයක් 2012.04.01 දින ආරම්භ කරන ලදී. ඔවුන් පහත සඳහන් කොන්දේසිවලට එකඟ විය.

- භානුක සහ හේමක පිළිවෙළින් රු. 450000 ක සහ රු. 750000 ක වාර්ෂික වැටුපකට හිමිකම් ලබයි.
- සෑම හවුල්කරුවකුට ම ප්‍රාග්ධනය මත වාර්ෂිකව 10% ක පොලියක් හිමි වේ.
- භානුක සහ හේමක අතර ලාභඅලාභ සම සමව බෙදා ගනු ලබයි.

2013.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ හවුල් ව්‍යාපාරය රු. 2400000 ක ලාභයක් ලැබීය. හවුල්කරුවන්ට හිමි වැටුප් සහ පොලී වර්ෂය තුළ දී මුදලින් ලබා ගෙන නොමැත.

2013.03.31 දින ශානක හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. ඔහු විසින් ප්‍රාග්ධනය ලෙස රු. 2000000 ක් ගෙන එන ලදී. මෙදින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 800000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කීර්තිනාමය වත්කමක් ලෙස පොත්වල සටහන් නොකළ අතර එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගලපන ලදී. භානුක, හේමක සහ ශානක 2013.04.01 දින සිට හවුල් ව්‍යාපාරයේ ලාභඅලාභ 2:2:1 අනුපාතයට බෙද ගැනීමට එකඟ විය.

[ හතරවෙනි පිටුව බලන්න.

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

16. 2013.03.31 දිනට භානුක සහ හේමකගේ ජංගම ගිණුම්වල ශේෂයන් කොපමණ ද?

| | භානුක (රු.) | හේමක (රු.) |
|---|---|---|
| (1) | 250000 | 250000 |
| (2) | 550000 | 650000 |
| (3) | 700000 | 1000000 |
| (4) | 1000000 | 1400000 |
| (5) | 1200000 | 1200000 |

(.........)

17. 2013.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ හිමිකමේ **වැඩි වීම** කොපමණ ද?

(1) රු. 800000 (2) රු. 2000000 (3) රු. 2800000 (4) රු. 3200000 (5) රු. 4400000 (.........)

18. 2013.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන් කොපමණ ද?

| | භානුක (රු.) | හේමක (රු.) | ශානක (රු.) |
|---|---|---|---|
| (1) | 3080000 | 4080000 | 1 840 000 |
| (2) | 3320000 | 4320000 | 2 160 000 |
| (3) | 3380000 | 4480000 | 2 040 000 |
| (4) | 3300000 | 4400000 | 2 000 000 |
| (5) | 3400000 | 4400000 | 2 000 000 |

(.........)

19. හිමිකම් කොටස් නිකුතුවක දී සියලු ම හිමිකම් දැනට සිටින කොටස්කරුවන් විසින් භාවිත කළේ නම්, සමාගමේ වත්කම් සහ හිමිකම්වල වටිනාකමට ඇතිවන බලපෑම කුමක් ද?

| | වත්කම් | හිමිකම් |
|---|---|---|
| (1) | වැඩි වේ. | වැඩි වේ. |
| (2) | අඩු වේ. | අඩු වේ. |
| (3) | අඩු වේ. | වැඩි වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. |
| (5) | වෙනස් නොවේ. | වෙනස් නොවේ. |

(.........)

20. පහත දැක්වෙන කුමන දෑ සමාගමක හිමිකමේ සංරචක ලෙස හඳුනාගනු ලබයි ද?

A - ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතය
B - ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්
C - ක්ෂය සඳහා වෙන් කිරීම
D - රඳවාගත් ඉපැයුම්

(1) A හා C පමණි (2) A හා D පමණි (3) B හා D පමණි
(4) C හා D පමණි (5) A, C හා D පමණි (.........)

21. පහත තොරතුරු 2013.03.31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමකට අදාළ වේ.

| | රු. '000 |
|---|---|
| වර්ෂය සඳහා ලාභය | 850 |
| ක්ෂය | 120 |
| ගොඩනැගිල්ල විකිණීමේ ලාභය | 50 |
| තොග වැඩි වීම් | 20 |
| ණයගැතියෝ අඩු වීම් | 40 |

වර්ෂයේ මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ වනුයේ:

(1) රු. 760 000 (2) රු. 800 000 (3) රු. 900 000 (4) රු. 920 000 (5) රු. 940 000 (.........)

22. පහත සඳහන් කුමන සිද්ධීන් සමාගමක මූල්‍ය ප්‍රකාශනවල වගකීම් සඳහා ප්‍රතිපාදනයක් හඳුනා ගැනීමට තුඩු දේ ද?

A - දෝෂ සහිත අයිතම අළුත්වැඩියා කිරීමේ වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකිණීම.
B - වර්ෂය අවසානයේ වෙළඳ ණයගැති ශේෂය මත අඩමාන ණය සඳහා වෙන් කිරීම.
C - නෛතික අවශ්‍යතාවක් නොමැති වුවත් නිෂ්පාදන ක්‍රියාවලිය හේතුවෙන් සිදු වූ පාරිසරික හානිය අවම කිරීම අවශ්‍ය වීම.

(1) A පමණි (2) B පමණි (3) A හා C පමණි
(4) B හා C පමණි (5) A, B හා C යන සියල්ල ම (.........)

23. සීමිත නන්දන පොදු සමාගමේ 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂකවරුන් විසින් 2013.05.31 දින අනුමත කරන ලදී. සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2013.06.15 දින පවත්වන ලදී. 2013.03.31 දිනට පසුව සමාගමට අදාළව පහත සිද්ධීන් ඇති විය.

A - කොළඹ සුරැකුම්පත් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්වල, සමාගම විසින් කළ ආයෝජනවල වෙළෙඳපොළ අගය 2013.04.01 දින සිට 2013.04.20 දින දක්වා අඩු වීම
B - 2012.10.01 දින සමාගමට එදිරිව නඩුවක් ගොනු කළ ප්‍රධාන ගනුදෙනුකරුවකු වෙත සමාගම විසින් වන්දි ගෙවිය යුතු යැයි 2013.04.30 දින උසාවිය විසින් තීන්දු කිරීම
C - 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොටසකට රු. 2 ක අවසන් ලාභාංශයක් 2013.06.10 දින ප්‍රකාශයට පත් කිරීම
D - 2013.03.31 දිනට පැවති තොගය එහි පිරිවැයට වඩා අඩු මිලකට 2013.05.25 දින විකිණීම

ඉහත කුමන සිද්ධීන් 2013.03.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතු ද?

(1) A හා C පමණි (2) A හා D පමණි (3) B හා D පමණි
(4) B, C හා D පමණි (5) A, B, C හා D යන සියල්ල ම (.........)

[ පස්වෙනි පිටුව බලන්න.

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

24. වෙළඳ ව්‍යාපාරයක යෙදෙන සමාගමක ජංගම අනුපාතය 3:1 ක් වේ. සමාගමේ පහත කුමන ගනුදෙනුව මෙම අනුපාතය අඩු වීමට බලපානු ලබයි ද?
    (1) දිගු කාලීන ණයක් ලබා ගැනීම  (2) ලාභයක් සහිතව තොග ණයට විකිණීම
    (3) යන්ත්‍රයක් අත්පිට මුදලට මිල දී ගැනීම  (4) ණයගැතියන්ගෙන් මුදල් ලැබීම
    (5) ණයහිමියන්ට මුදල් ගෙවීම (………)

25. පහත තොරතුරු සමාගමක 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

| | රු.'000 |
|---|---|
| විකුණුම් | 900 |
| විකුණුම් පිරිවැය | 600 |
| 2012.04.01 දිනට තොගය | 125 |
| 2013.03.31 දිනට තොගය | 175 |

වර්ෂයක් සඳහා වැඩ කරන දින 360 ක් බව උපකල්පනය කරන්න.
2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ තොග රැඳවුම් කාලය:
(1) දින 60  (2) දින 70  (3) දින 75  (4) දින 90  (5) දින 105 (………)

26. ආයතනයක් භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයකට අදාළව පහත තොරතුරු දී ඇත.

| | උපරිම | අවම |
|---|---|---|
| පරිභෝජනය (ඒකක) | 600 | 200 |
| පොරොත්තු කාලය (සති) | 6 | 3 |

මෙම අමුද්‍රව්‍යයේ අවම තොග මට්ටම කොපමණ ද?
(1) ඒකක 600  (2) ඒකක 1 800  (3) ඒකක 3 000  (4) ඒකක 3600  (5) ඒකක 4 400 (………)

27. සමාගමක් විසින් නිපදවන භාණ්ඩයකට අදාළව පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | රු. 600 000 |
| අයවැයගත පොදු කාර්ය පිරිවැය - නිෂ්පාදන දෙපාර්තමේන්තුව | රු. 350 000 |
| - සේවා දෙපාර්තමේන්තුව | රු. 50 000 |
| නිෂ්පාදන ඒකක සංඛ්‍යාව | ඒකක 75 000 |
| අයවැයගත යන්ත්‍ර පැය | 50 000 (ඒකකයකට යන්ත්‍ර පැය = 5) |

යන්ත්‍ර පැයකට පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය සහ ඒකකයක නිෂ්පාදන පිරිවැය වන්නේ :

| | යන්ත්‍ර පැයකට පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය (රු.) | ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.) |
|---|---|---|
| (1) | 6 | 38 |
| (2) | 7 | 43 |
| (3) | 7 | 15 |
| (4) | 8 | 16 |
| (5) | 8 | 48 |

(………)

● **ප්‍රශ්න අංක 28 සහ 29 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් 2013.04.01 දින නව භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම ආරම්භ කරන ලද අතර එම භාණ්ඩ ඒකකයක් රු. 200 බැගින් විකුණනු ලබයි. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දරණ ලද පිරිවැය පහත පරිදි වේ.

| | |
|---|---|
| ඒකකයක විචල්‍ය පිරිවැය: | |
| සෘජු ද්‍රව්‍ය | රු. 40 |
| සෘජු ශ්‍රමය | රු. 25 |
| නිෂ්පාදන පොදු කාර්යය | රු. 20 |
| විකුණුම් හා බෙදාහැරීමේ පොදු කාර්යය | රු. 15 |
| වාර්ෂික ස්ථාවර පිරිවැය: | |
| නිෂ්පාදන පොදු කාර්යය | රු. 200 000 |
| විකුණුම් හා බෙදාහැරීමේ පොදු කාර්යය | රු. 350 000 |
| නිෂ්පාදනය | ඒකක 20 000 |

28. ඒකකයක ප්‍රාථමික පිරිවැය සහ ඒකක 20 000 දී මුළු නිෂ්පාදන පිරිවැය පිළිවෙළින්:
    (1) රු. 65 සහ රු. 1 500 000  (2) රු. 65 සහ රු. 1 900 000  (3) රු. 85 සහ රු. 1 900 000
    (4) රු. 85 සහ රු. 2 200 000  (5) රු. 100 සහ රු. 2 200 000 (………)

29. ඒකකයක දායකය සහ ඒකක 20 000 දී ලාභය පිළිවෙළින්:
    (1) රු. 90 සහ රු. 1 250 000  (2) රු. 100 සහ රු. 1 450 000  (3) රු. 115 සහ රු. 1 750 000
    (4) රු. 125 සහ රු. 1 950 000  (5) රු. 135 සහ රු. 2 150 000 (………)

30. අනෙකුත් සාධක ස්ථාවරව පවතිද්දී විකුණුම් මිලෙහි අඩු වීමක් සහ ස්ථාවර පිරිවැයෙහි වැඩිවීමක් සිදුවන විට පහත කුමන ප්‍රකාශ නිවැරදි වේ ද?
    A - සමච්ඡේද ලක්ෂ්‍යයෙහි වෙනසක් සිදු නොවේ.  B - සමච්ඡේද ලක්ෂ්‍යය අඩු වේ.
    C - සමච්ඡේද ලක්ෂ්‍යය වැඩි වේ.  D - ලාභය අඩු වේ.
    E - දායකය අඩු වේ.
    (1) A හා B පමණි  (2) A, B හා E පමණි  (3) A, B, C හා D පමණි
    (4) C හා D පමණි  (5) C, D හා E පමණි (………)

[ හයවෙනි පිටුව බලන්න.

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

● අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

31. අදාළ තීරුවේ ලකුණක් යොදමින් පහත ප්‍රකාශ **සත්‍ය** හෝ අසත්‍ය බව දක්වන්න.

| ප්‍රකාශය | සත්‍ය | අසත්‍ය |
|---|---|---|
| A - කළමනාකරණ ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ ව්‍යාපාරයක් පිළිබඳ ඇල්මක් දක්වන අභ්‍යන්තර පාර්ශ්වයන්ට ආයතනයක් පිළිබඳ තීරණ ගැනීමට තොරතුරු සැපයීමයි. | ......... | ......... |
| B - ආයතනයක මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණක් ගිණුම් පොත්වල සටහන් කෙරේ. | ......... | ......... |
| C - ආයතනයක තොරතුරු භාවිත කරන බාහිර පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සපයනු ලැබේ. | ......... | ......... |
| D - ආර්ථික තීරණ ගැනීමේ සමාජයීය අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් ගිණුම්කරණය විකාශනය වී ඇත. | ......... | ......... |

32. ව්‍යාපාරයක සිදු වූ පහත ගනුදෙනු සහ සිද්ධි ගිණුම් වර්ෂ අවසානයේ එහි වත්කම්, වගකීම්, සහ හිමිකම් ශේෂයන් **වැඩිවීමට, අඩුවීමට හෝ වෙනස් නොවීමට** හේතු වන්නේ දැයි සඳහන් කරන්න.

| ගනුදෙනුව | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| A - අයිතිකරුවන්ගෙන් ප්‍රාග්ධනය ලබා ගැනීම | .................. | .................. | .................. |
| B - අඩමාන ණය සඳහා වෙන් කිරීම | .................. | .................. | .................. |
| C - පොලිය සහිතව ණය වාරිකයක් ගෙවීම | .................. | .................. | .................. |
| D - වර්ෂය අවසානයේ දී සාමාන්‍ය කොටස් හිමියන්ට ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම | .................. | .................. | .................. |

33. පහත එක් එක් ගනුදෙනුව වාර්තා කිරීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිල්ල සහ අදාළ මූලික සටහන් පොත සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලියවිල්ල | මූලික සටහන් පොත |
|---|---|---|
| A - තොග ණයට විකිණීම | .............................. | .............................. |
| B - ණයගැතියකු විසින් භාණ්ඩ ආපසු එවීම | .............................. | .............................. |
| C - ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | .............................. | .............................. |
| D - බොල්ණය කපා හැරීම | .............................. | .............................. |

34. මාසයක ආරම්භයේ දී ව්‍යාපාරයේ සුළු මුදල් භාරකරුට, සුළු මුදල් අග්‍රිමය ලෙස රු. 10000 ක් ලබා දී ඇත. මාසය අවසානයේ දී ඔහු රු. 8000 ක් ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලා සිටින ලදී.

පහත දෑ සඳහන් කරන්න.

(අ) මාසයේ සුළු මුදල් වියදම් (රු.) : ..............................................................................

(ආ) ප්‍රතිපූර්ණය සටහන් කිරීමට ජර්නල් සටහන *(සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)* :

..............................................................................................................................

..............................................................................................................................

35. 2013.03.01 දින ව්‍යාපාරයක ණයගැති පාලන ගිණුමේ හර ශේෂය රු. 50000 ක් විය. 2013 මාර්තු මාසයේ විකුණුම් ජර්නලයේ එකතුව වූ රු. 520000, ණයගැති පාලන ගිණුමේ රු. 250000 ක් ලෙස සටහන් කර ඇත. කෙසේ නමුත් විකුණුම් ගිණුමේ නිවැරදි අගය සටහන් කර ඇත. මාසය තුළ දී ණයගැතියන් රු. 200000 ක් ගෙවා ඇත. මාසය අවසාන ණයගැති ශේෂය මත අඩමාන ණය සඳහා 10% ක් වෙන් කර ඇත. ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් ලියා දක්වන්න. *(සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)*

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

36. ආයතනයක් විසින් වත්කම සම්බන්ධයෙන් ගිණුම් තැබීමේදී ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැරව ක්‍රියා කළ හැකි අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

[ හත්වෙනි පිටුව බලන්න.

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

37. ඇගළුම් කර්මාන්තශාලාවක පහත එක් එක් අවස්ථාවට **වඩාත්** අදාළ වන ගිණුම්කරණ සංකල්පය දක්වන්න.

A - රෙදි තොගය ජංගම වත්කම් ලෙසත් මහන මැෂින් ජංගම නොවන වත්කම් ලෙසත් වර්ග කිරීම

B - වර්ෂය තුළ දී ගෙවූ කර්මාන්ත ශාලා කුලියෙන් කොටසක් ඉදිරියට කළ ගෙවීමක් ලෙස හඳුනා ගැනීම

C - වර්ෂය අවසාන රෙදි තොගය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට අගය කිරීම

D - ඇගළුම් විකුණන අවස්ථාවේ දී විකුණුම් ආදායම හඳුනා ගැනීම

**අයිතමය** **ගිණුම්කරණ සංකල්පය**

A - ..........................................................................

B - ..........................................................................

C - ..........................................................................

D - ..........................................................................

38. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවට අනුව වගකීමක තිබිය යුතු මූලික ලක්ෂණ **තුන** සඳහන් කරන්න.

..........................................................................

..........................................................................

..........................................................................

39. 2013.03.31 දිනට එක්සත් ක්‍රීඩා සමාජයේ සාමාජිකයෝ 50 ක් වූහ. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1000 කි. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී, සාමාජික මුදල් ලෙස රු. 45000 ක් මුදලින් ලැබුණි. 2013.03.31 සහ 2012.03.31 දිනට කලින් ලද සාමාජික මුදල් පිළිවෙළින් රු. 5 000 ක් සහ රු. 3 000 ක් විය.
පහත දෑ ගණනය කරන්න:

(අ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම (රු.) ..........................................

(ආ) 2013.03.31 දිනට හිඟහිටි සාමාජික මුදල (රු.) ..........................................

● **ප්‍රශ්න අංක 40 සහ 41 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

බිනු සහ ධනු හවුල් ව්‍යාපාරයේ ජංගම ගිණුම් ශේෂයන් පහත පරිදි වේ.

| | 2013.03.31 දිනට (රු. '000) | 2012.03.31 දිනට (රු. '000) |
|---|---|---|
| බිනු | 960 | 500 |
| ධනු | 940 | 600 |

හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- බිනු සහ ධනු පිළිවෙළින් රු. 240000 ක සහ රු. 360000 ක වාර්ෂික වේතනයකට හිමිකම් ලබයි.
- බිනු සහ ධනු අතර පිළිවෙළින් 3:2 අනුපාතයට ලාභඅලාභ බෙද ගනු ලැබේ.

2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බිනුට සහ ධනුට පිළිවෙළින් රු. 200000 ක සහ රු. 300000 ක වේතන ගෙවා ඇත.

40. 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය ඉපැයූ ලාභය කොපමණ ද?

..........................................................................

41. ඔවුන්ට හිමි වේතන ගෙවා නොමැති නම්, 2013.03.31 දිනට බිනු සහ ධනුගේ ජංගම ගිණුම් ශේෂ කොපමණ ද?

බිනු (රු.) .......................................... — ධනු (රු.) ..........................................

42. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ට (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් සහ වැරදි) අනුව ආයතනයකට එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා **දෙක** සඳහන් කරන්න.

..........................................................................

..........................................................................

● **ප්‍රශ්න අංක 43 සහ 44 ට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

ආයතනයක් විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ පහත කොන්දේසි මත යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී:

- කල්බදු කාලය වසර 3 කි.
- රු. 250000 ක වාර්ෂික කල්බදු වාරිකයක් වසර අග ගෙවිය යුතුය.
- කල්බදු ගිවිසුමේ ගම්‍ය පොළී අනුපාතය 10% කි.
- අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය රු. 621725 කි.

43. කල්බදු ගිවිසුම ආරම්භයේ දී කල්බදු ගැනුම්කරුගේ පොත්වල කල්බදු වගකීම හඳුනාගැනීම සඳහා ජර්නල් සටහන ලියා දක්වන්න. (සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)

..........................................................................

..........................................................................

[ අටවෙනි පිටුව බලන්න.

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

44. කල්බදු ගැනුම්කරුගේ පොත්වල පහත දෑ ගණනය කරන්න.

(අ) පළමු වසර සඳහා කල්බදු පොලිය (රු.) : .......................................................

(ආ) පළමු වර්ෂය අවසානයේ දී කල්බදු වගකීම (රු.) : .......................................................

45. 2013.03.31 දිනට සමාගමක ජංගම අනුපාතය 2.5 : 1 ක් වූ අතර එහි ජංගම වගකීම් රු. 120000 ක් විය. මෙදිනට සමාගම සතුව රු. 180000 ක් වටිනා තොග තිබුණි.

(අ) 2013.03.31 දිනට ජංගම වත්කම්වල වටිනාකම කොපමණ ද? .......................................................

(ආ) 2013.03.31 දිනට ක්ෂණික අනුපාතය කොපමණ ද? .......................................................

46. පහත එක් එක් අවස්ථාවේ සමාගමක ණය - හිමිකම් අනුපාතය **වැඩි වේ ද, අඩු වේ ද, වෙනස් නොවේ ද** යන්න සඳහන් කරන්න.

| **අවස්ථාව** | **ණය - හිමිකම් අනුපාතය මත බලපෑම** |
|---|---|
| A - වත්කම් ඉහළ අගයකට ප්‍රත්‍යාගණනය කිරීම | ....................................... |
| B - දිගු කාලීන ණයක් ලබා ගැනීම | ....................................... |
| C - ණයට භාණ්ඩ මිල දී ගැනීම | ....................................... |
| D - නව කොටස් නිකුතුවක් සිදු කිරීම | ....................................... |

47. ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක පහත සඳහන් කුමන පිරිවැය අයිතම ප්‍රාථමික පිරිවැයෙහි උපාංග ලෙස වර්ග කළ හැකි ද?

| **පිරිවැය අයිතමය** | **ප්‍රාථමික පිරිවැයෙහි උපාංගයකි (ඔව්/නැත)** |
|---|---|
| A - වඩුකාර්මික වේතන | ....................................... |
| B - කර්මාන්තශාලාවේ විදුලි ගාස්තු | ....................................... |
| C - භාවිත කළ ලීවල පිරිවැය | ....................................... |
| D - යන්ත්‍ර ක්ෂය | ....................................... |

● **ප්‍රශ්න අංක 48 සහ 49 ට පිළිතුරු සැපයීමට පහත දී ඇති තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් විසින් විශේෂිත වර්ගයක ජංගම දුරකථනයක් නිෂ්පාදනය කර ඒකකයක් රු. 25000 ක මිලකට විකුණනු ලබයි. සමාගමේ ඉදිරි වර්ෂය සඳහා අයවැයගත විකුණුම්, ඒකක 400 ක් වන අතර එය එහි ධාරිතාවයෙන් 80% කට සමාන වේ. මෙම මෙහෙයුම් මට්ටමේදී අයවැයගත පිරිවැය පහත පරිදි වේ.

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | රු. 4000000 |
| සෘජු ශ්‍රමය | රු. 2000000 (නිපදවන ඒකක ප්‍රමාණය මත ගෙවනු ලැබේ) |
| මුළු පොදු කාර්යය පිරිවැය: | ස්ථාවර රු. 750000, විචල්‍ය රු. 1000000 |

48. පහත දෑ ගණනය කරන්න:

(අ) සමච්ඡේද ලක්ෂ්‍යය (ඒකක) : .......................................................

(ආ) ආරක්ෂිත ආන්තිකය (රුපියල්) : .......................................................

49. විකුණුම් මිල 10% කින් අඩු වීම නිසා, විකුණුම් ඒකක ගණන සමාගමේ ධාරිතාවයෙන් 90% ක් දක්වා වැඩි වූයේ නම්, ලාභයේ **වැඩි වීම හෝ අඩු වීම** කොපමණ ද?

.......................................................

50. අනිකුත් සාධක වෙනස් නොවන්නේ නම් පහත එක් එක් අවස්ථා නිසා ආයෝජන ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය **වැඩි වේ ද, අඩු වේ ද, වෙනස් නොවේ ද** යන්න සඳහන් කරන්න.

| **අවස්ථාව** | **ශුද්ධ වර්තමාන අගය මත බලපෑම** |
|---|---|
| A - ආරම්භක ආයෝජනයේ වැඩි වීමක් | : ....................................... |
| B - වාර්ෂික ක්ෂයවීම්වල වැඩි වීමක් | : ....................................... |
| C - අපේක්ෂිත වාර්ෂික මුදල් ගලා යෑම්වල අඩු වීමක් | : ....................................... |
| D - වට්ටම් අනුපාතයේ අඩු වීමක් | : ....................................... |

* * *

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස් :

- ※ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හයකට** **පමණක්** පිළිතුරු සපයන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- ※ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

1. 2013.03.31 දිනට සීමිත පුබුදු පොදු සමාගමේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| 2013.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ (ධාරණ වටිනාකමට) | 5400 | |
| 2012.04.01 දිනට තොගය | 400 | |
| වෙළෙඳ ණයගැතියෝ | 400 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 250 | |
| ගැනුම් | 1500 | |
| සේවක වැටුප් | 400 | |
| කාර්යාල කුලී | 360 | |
| දේපළ, පිරියත සහ උපකරණ මත ප්‍රවර්තන වර්ෂයේ ක්ෂය | 700 | |
| දුරකථන ගාස්තු | 40 | |
| අතුරු ලාභාංශ | 180 | |
| විකුණුම් කොමිස් | 50 | |
| කල්බදු වාරිකය | 930 | |
| බදු (ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා ගෙවන ලද) | 50 | |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 2000 |
| 2012.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 1380 |
| කල්බදු ණයහිමියෝ | | 2400 |
| වෙළෙඳ ණයහිමියෝ | | 350 |
| විකුණුම් | | 4500 |
| 2012.04.01 දිනට අඩමාණ ණය සඳහා වෙන් කිරීම | | 30 |
| | **10660** | **10660** |

**අතිරේක තොරතුරු:**

(අ) 2013.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල සංයුතිය පහත පරිදි වේ:

| වත්කම | පිරිවැය (රු.'000) | සමුච්චිත ක්ෂය (රු.'000) | ධාරණවටිනාකම (රු.'000) |
|---|---|---|---|
| ගොඩනැගිල්ල | 2000 | 1200 | 800 |
| මෝටර් රථය (2012.04.01 දින මූල්‍ය කල්බදු පදනම මත අත්පත් කර ගත්) | 2400 | - | 2400 |
| ලී බඩු සහ සවිකිරීම් | 1000 | 400 | 600 |
| කාර්යාලීය උපකරණ (2012.04.01 දින අත්පත් කර ගත්) | 2000 | 400 | 1600 |
| | **7400** | **2000** | **5400** |

(ආ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය පහත අයිතමයන්ගෙන් සමන්විත වේ. සියලු ම වත්කම් පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ.

| වත්කම | ක්ෂය (රු.'000) |
|---|---|
| ගොඩනැගිල්ල | 200 |
| ලී බඩු සහ සවිකිරීම් | 100 |
| කාර්යාලීය උපකරණ | 400 |
| | **700** |

මූල්‍ය කල්බදු පදනම මත අත්පත් කර ගත් මෝටර් රථය සඳහා මේ දක්වා ක්ෂය වෙන් කර නොමැත.

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

[ 2 වැනි පිටුව බලන්න.

(ඉ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත ගැලපීම් කළ යුතු වේ.

(i) 2013.03.31 දින ගොඩනැගිල්ල රු. 1 000 000 කට අත්පිට මුදලට විකුණන ලදී. මෙම වටිනාකම බැංකු ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර ඇත. ගොඩනැගිල්ලෙහි පිරිවැය සහ සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් කර නොමැත.

(ii) මෝටර් රථයේ කල්බදු කාලය වසර 4 ක් වන අතර එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 5 කි. කල්බදු කාලය අවසානයේ දී මෝටර් රථයේ අයිතිය සමාගමට පැවරේ. වාර්ෂික කල්බදු වාරිකය රු. 930 000 ක් වේ. වර්ෂය තුළ දී ගෙවන ලද වාරිකය කල්බදු වාරික ගිණුමකට හර කර ඇත. වසර 4 ක කාලය සඳහා කල්බදු පොලිය පහත පරිදි වේ.

| වසර | පොලිය (රු.'000) |
|---|---|
| 2012 / 13 | 480 |
| 2013 / 14 | 390 |
| 2014 / 15 | 290 |
| 2015 / 16 | 160 |

(iii) 2013.03.31 දිනට තොගයේ පිරිවැය රු. 800 000 ක් විය. එදිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 780 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(iv) වර්ෂය අවසානයේ වෙළෙඳ ණයගැති ශේෂය මත වාර්ෂිකව 10% ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ.

(v) 2012.04.01 දින වසර දෙකක් සඳහා එකවර කුලී ගෙවමින් කාර්යාල පරිශ්‍රය ලෙස භාවිත කිරීමට ගොඩනැගිල්ලක් කුලියට ගන්නා ලදී. ගෙවන ලද මුළු මුදල කාර්යාල කුලී ගිණුමට හර කර ඇත.

(vi) 2013 මාර්තු මාසය සඳහා දුරකථන ගාස්තු රු. 10 000 ක් ගෙවිය යුතු වේ.

(vii) සමාගම විසින් වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. මෙම වගකීම් සහතිකය සඳහා විකුණුම් අගය මත 2% ක ප්‍රතිපාදනයක් කළ යුතු යැයි විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීත කරමින් කොටසක් රු. 50 බැගින් සාමාන්‍ය කොටස් 20 000 ක් දැනට සිටින කොටස්කරුවන්ට නිකුත් කර ඇත.

(ix) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු, බදු පෙර ලාභයෙන් $\frac{1}{4}$ ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**අවශ්‍යවන්නේ:**

ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත පුබ්ලික් පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(2) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2013.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ශේෂ පත්‍රය) *(ලකුණු 20 යි)*

2. (අ) මහේන්ද්‍ර, නාරද සහ රාජිත ලාභඅලාභ පිළිවෙලින් 5:3:2 අනුපාතයට බෙදා ගන්නා වෙළඳ ව්‍යාපාරයක හවුල්කරුවෝ ය. 2012.03.31 දිනට මෙම හවුල් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ශේෂ පත්‍රය) පහත පරිදි විය.

| | රු.'000 | රු.'000 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල, පිරියත සහ උපකරණ - පිරිවැයට | 1000 | |
| සමුච්චිත ක්ෂය | (200) | 800 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 200 | |
| වෙළෙඳ ණයගැතියෝ | 450 | |
| මුදල් | 60 | 710 |
| | | **1510** |
| **ප්‍රාග්ධන ගිණුම්** | | |
| මහේන්ද්‍ර | 200 | |
| නාරද | 400 | |
| රාජිත | 200 | 800 |
| **ජංගම ගිණුම්** | | |
| මහේන්ද්‍ර | 150 | |
| නාරද | 100 | |
| රාජිත | 60 | 310 |
| **ජංගම නොවන වගකීම්** | | |
| 5% ණය - නාරද | | 200 |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ණයහිමියෝ | | 200 |
| | | **1510** |

[3 වැනි පිටුව බලන්න

අතිරේක තොරතුරු :

(i) 2012.04.01 දින රාජිත හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. ඔහුට ගෙවිය යුතු මුදල ණයක් ලෙස සැලකීමටත් ඒ සඳහා 5% ක වාර්ෂික පොලියක් ගෙවීමටත් එකඟ විය. එදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 200 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර ඒ සඳහා සියලු ගැළපීම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් කළ යුතු වේ.

(ii) මහේන්ද්‍ර සහ නාරද පහත කොන්දේසි මත හවුල් ව්‍යාපාරය පවත්වා ගැනීමට එකඟ විය:

(අ) සෑම හවුල්කරුවකුට ම රු. 120 000 ක වාර්ෂික වේතනයක් හිමි වේ.

(ආ) ලාභඅලාභ සම සමව බෙදා ගනී.

(iii) වර්ෂය තුළ දී මහේන්ද්‍ර සහ නාරද පිළිවෙළින් රු. 200 000 ක සහ රු. 150 000 ක ගැනිලි මුදලින් ලබා ගෙන ඇත.

(iv) හවුල් ව්‍යාපාරයේ සියලුම විකුණුම් සහ ගැනුම් ණය පදනම මත කරනු ලැබේ. වර්ෂය තුළ දී ණයගැතියන්ගෙන් රු. 1 800 000 ක් එකතු කර ගන්නා ලද අතර ණයහිමියන්ට රු. 900 000 ක් ගෙවන ලදී.

(v) වර්ෂය තුළ ගෙවූ මෙහෙයුම් වියදම් රු. 350 000 කි.

(vi) ණය සඳහා පොලී ගෙවිය යුතු වේ.

(vii) දේපළ, පිරියත සහ උපකරණ පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

(viii) 2013.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් පහත පරිදි වේ.

| | රු.'000 |
|---|---|
| තොගය | 275 |
| වෙළෙඳ ණයගැතියෝ | 500 |
| මුදල් | 260 |
| වෙළෙඳ ණයහිමියෝ | 300 |

**අවශ්‍යවන්නේ:**

මහේන්ද්‍ර සහ නාරද හවුල් ව්‍යාපාරයේ පහත දෑ:

(1) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන විසර්ජනයන් ද ඇතුළුව)

(2) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

(3) 2013.03.31 දිනට රාජිතගේ ණය ගිණුම

(ලකුණු 10 යි)

(ආ) නිෂ්පාදන සමාගමක අසම්පූර්ණ අයවැයගත පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාවක් පහත දී ඇත:

| පොදු කාර්ය පිරිවැය | විභජන පදනම | යන්ත්‍ර දෙපාර්තමේන්තුව (රු.'000) | නිමැවුම් දෙපාර්තමේන්තුව (රු.'000) | නඩත්තු දෙපාර්තමේන්තුව (රු.'000) | එකතුව (රු.'000) |
|---|---|---|---|---|---|
| බෙදහරින ලද පොදු කාර්ය පිරිවැය | | 820 | 480 | 190 | 1 490 |
| විදුලිය | | | | | 240 |
| කුලිය | | | | | 180 |
| යන්ත්‍ර ක්ෂය | | | | | 150 |
| සේවක සුබසාධන වියදම් | | | | | 300 |

**අතිරේක තොරතුරු:**

(i)

| විස්තරය | යන්ත්‍ර දෙපාර්තමේන්තුව | නිමැවුම් දෙපාර්තමේන්තුව | නඩත්තු දෙපාර්තමේන්තුව | එකතුව |
|---|---|---|---|---|
| කිලෝවොට් පැය | 15 000 | 6 000 | 3 000 | 24 000 |
| යන්ත්‍ර පිරිවැය (රු.) | 1 000 000 | 500 000 | - | 1 500 000 |
| බිම් ප්‍රමාණය (වර්ග මීටර) | 200 | 100 | 60 | 360 |
| සේවක සංඛ්‍යාව | 25 | 100 | 25 | 150 |

(ii) නඩත්තු දෙපාර්තමේන්තුව එහි සේවාවන්ගෙන් 60% ක් යන්ත්‍ර දෙපාර්තමේන්තුවටත් ඉතිරිය නිමැවුම් දෙපාර්තමේන්තුවටත් සපයයි.

(iii) යන්ත්‍ර දෙපාර්තමේන්තුව සහ නිමැවුම් දෙපාර්තමේන්තුව පිළිවෙළින් යන්ත්‍ර පැය සහ සෘජු ශ්‍රම පැය මත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබයි.

(iv) සමාගම විසින් නිපදවනු ලබන භාණ්ඩ දෙක සඳහා පහත තොරතුරු අදාළ වේ.

| විස්තරය | A වර්ගය | B වර්ගය |
|---|---|---|
| ඒකකයක ප්‍රාථමික පිරිවැය (රු.) | 700 | 720 |
| ඒකකයක් සඳහා අවශ්‍ය පැය (අයවැයගත): | | |
| - යන්ත්‍ර පැය | 5 | 6 |
| - සෘජු ශ්‍රම පැය | 4 | 8 |
| නිෂ්පාදන ඒකක (අයවැයගත) | 1 000 | 1 500 |

**අවශ්‍යවන්නේ:**

(1) සම්පූර්ණ කරන ලද පොදු කාර්යය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (නඩත්තු දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය පිරිවැය නැවත විභජනය ද ඇතුළුව )

(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) 'A' හා 'B' භාණ්ඩ සඳහා ඒකකයක නිෂ්පාදන පිරිවැය

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 20 යි)

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

[4 වැනි පිටුව බලන්න.

3. 2013.01.01 දින සුනිමල් වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2013 ජනවාරි මාසය තුළ දී ව්‍යාපාරයේ ගනුදෙනු පහත පරිදි වේ.

| අංකය | දිනය | ගනුදෙනුව |
|---|---|---|
| (i) | 2013.01.01 | සුනිමල් විසින් රු. 400000 ක මුදලක් සහ රු. 840000 ක් වටිනා වෑන් රථයක් ව්‍යාපාරයේ ආයෝජනය කරන ලදී. |
| (ii) | 2013.01.01 | රු. 240000 ක් වටිනා ලී බඩු සහ සවිකිරීම් මිල දී ගන්නා ලදී. |
| (iii) | 2013.01.08 | රු. 100000 ක් වටිනා භාණ්ඩ මිල දී ගන්නා ලද අතර මුළු වටිනාකමට චෙක්පතක් නිකුත් කරන ලදී. |
| (iv) | 2013.01.12 | රු. 80000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 130000 කට විකුණන ලද අතර මෙම වටිනාකම සඳහා චෙක්පතක් ලැබුණි. |
| (v) | 2013.01.15 | රු. 150000 ක් වටිනා භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී. |
| (vi) | 2013.01.20 | රු. 140000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 200000 කට ණයට විකුණන ලදී. |
| (vii) | 2013.01.23 | ණයහිමියන්ට ගෙවිය යුතු වටිනාකමෙන් කොටසක් පියවීමට රු. 90000 ක චෙක්පත් නිකුත් කරන ලද අතර රු. 5000 ක වට්ටමක් ලැබුණි. |
| (viii) | 2013.01.25 | රු. 90000 ක මෙහෙයුම් වියදම් ගෙවන ලදී. |
| (ix) | 2013.01.26 | ණයගැතියන්ගෙන් රු. 150000 ක් ලද අතර එම මුදල බැංකුවේ තැන්පත් කරන ලදී. |

**අතිරේක තොරතුරු :**

(i) ව්‍යාපාරයේ සියලුම මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් ආශ්‍රයෙන් සිදු කරනු ලැබේ.

(ii) 2013.01.31 දිනට ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනයේ ශේෂය එදිනට මුදල් පොතේ ශේෂය සමඟ පහත සඳහන් කරුණු හේතුවෙන් එකඟ නොවීය.

(අ) ණයගැතියකු විසින් බැංකුවේ සෘජුව ම තැන්පත් කළ රු. 30000 ක චෙක්පතක් මුදල් පොතේ සටහන් වී නොමැත.

(ආ) රු. 2000 ක් වූ බැංකු ගාස්තු මුදල් පොතේ සටහන් වී නොමැත.

(ඉ) ණයහිමියන්ට නිකුත් කරන ලද චෙක්පත් අතුරෙන් රු. 20000 ක චෙක්පතක් ගෙවීමට ඉදිරිපත් කර නොමැත.

(iii) දේපළ, පිරියත සහ උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(iv) මාසය අවසානයේ ණයගැති ශේෂය මත 10% ක අඩමාන ණය වෙන් කිරීමක් සිදු කළ යුතුය.

**අවශ්‍යවන්නේ:**

(1) ඉහත අංක (i) සිට (ix) දක්වා ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද අඩු වේ නම් (−) ද යන්න සඳහන් කිරීම. (පහත ආකෘතිය භාවිත කරන්න.)

| ගනුදෙනු අංකය | වත්කම් | | | | | වගකීම් | හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | මෝටර් රථය | ලී බඩු සහ සවිකිරීම් | තොගය | ණය ගැතියෝ | බැංකු | | |
| | | | | | | | |
| | | | | | | | |

(2) ඉහත බැංකු තීරුවේ ශේෂය යොදා ගනිමින්, 2013.01.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සහ මුදල් පොතේ සංශෝධිත ශේෂය ගණනය කිරීම

(3) 2013.01.31 දිනෙන් අවසන් මාසය සඳහා සුනිමල්ගේ ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය

***(ලකුණු 15 යි)***

4. (අ) රොෂාන් විසින් ඔහුගේ පුද්ගලික පරිභෝජනය සඳහා වූ මෝටර් රථය යොදා ගනිමින් විවාහ මංගල උත්සව සඳහා රථවාහන කුලියට දීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරයි. මෝටර් රථය සඳහා ඇස්තමේන්තු වියදම් පහත පරිදි වේ.

| | |
|---|---|
| වාර්ෂික රක්ෂණය | - රු. 58000 |
| වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තු | - රු. 8000 |
| මාසික පිළිසකර කිරීම් සහ නඩත්තු ගාස්තු | - රු. 5000 |
| වාර්ෂික ක්ෂය | - රු. 500000 |
| රියදුරුගේ වැටුප | - මසකට රු. 9000 ක් සහ කුලී ආදායමෙන් 10% කි. |
| පෙට්‍රල් වියදම | - කිලෝමීටරයකට රු. 20 කි. |

පහත සඳහන් දෑ ද ඇස්තමේන්තු කර ඇත.

| | |
|---|---|
| වාර්ෂික පරිපාලන වියදම් | - රු. 50000 |
| මෝටර්රථ කුලී ආදායම | - කිලෝමීටරයකට රු. 100 කි. |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැය ආවරණය කිරීමට ධාවනය කළ යුතු කිලෝමීටර ගණන

(2) වර්ෂයක් තුළ දී ව්‍යාපාරය රු. 350000 ක ලාභයක් අපේක්ෂා කරන්නේ නම් ධාවනය කළ යුතු කිලෝමීටර ගණන

***(ලකුණු 05 යි)***

paperhub.lk

(ආ) උදර ක්‍රීඩා සමාජය සාමාජිකයන්ගේ භාවිතය සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සහ පිහිනුම් තටාකයක් පවත්වා ගෙන යයි. 2013.03.31 සහ 2012.03.31 දිනට එහි වත්කම් සහ වගකීම් පහත පරිදි වේ.

| | 2013.03.31 දිනට (රු. '000) | 2012.03.31 දිනට (රු. '000) |
|---|---|---|
| ගොඩනැගිලි (ධාරණ වටිනාකමට) | 2 000 | 2 400 |
| පිහිනුම් තටාකය (ධාරණ වටිනාකමට) | 3 750 | 4 000 |
| කලින් ලද පිහිනුම් තටාක කුලී | 50 | 60 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 90 | 80 |
| ස්ථාවර තැන්පතුව | 1 200 | - |
| මුදල් | ? | 100 |

2013.03.31 දිනෙන් අවසන් වර්ෂයට පහත තොරතුරු අදාළ වේ.

(i) පහත දී ඇති සියලු වියදම් මුදලින් ගෙවා ඇත.

| | රු. '000 |
|---|---|
| පිහිනුම් තටාක භාරකරුගේ වාර්ෂික වැටුප | 300 |
| අනෙකුත් සේවකයන්ගේ වාර්ෂික වැටුප් | 1 200 |
| අනිකුත් වියදම් | 300 |

(ii) පිහිනුම් තටාකය බාහිර ආයතනවලට ද කුලියට දෙනු ලැබේ. ප්‍රවර්තන වර්ෂය තුළ දී අයකළ ගාස්තු සහ කුලියට දුන් දින ගණන පහත පරිදි වේ.

| ගාස්තුව (රු.) | කුලියට දුන් දින ගණන |
|---|---|
| දිනකට රු. 50 000 | 30 |
| දින භාගයකට රු. 25 000 | 20 |

(iii) සාමාජිකයකුගේ මාසික සාමාජික මුදල රු. 1 000 කි. 2012.04.01 දින සාමාජිකයන් 100 දෙනකු සිටි අතර එදින නව සාමාජිකයන් 10 දෙනකු ක්‍රීඩා සමාජයට බැඳුණි. නව සාමාජිකයන් විසින් වර්ෂය සඳහා මුළු සාමාජික මුදල ගෙවන ලදී. ආරම්භක සාමාජිකයින්ගෙන් 15 දෙනකු 2012.09.30 දින ඉවත් වූ අතර එදින දක්වා ඔවුන් විසින් ගෙවිය යුතු සාමාජික මුදල් නිසි පරිදි ගෙවා තිබුණි. 2012.03.31 දිනට හිඟව තිබූ මුළු සාමාජික මුදල ප්‍රවර්තන වර්ෂය තුළ දී ලැබුණි.

(iv) ක්‍රීඩා සමාජයේ ආපනශාලාව බාහිර ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන අතර එහි ආදායමෙන් 20% ක් ක්‍රීඩා සමාජයට ගෙවිය යුතු වේ. වර්ෂය තුළ දී ආපනශාලාවේ ආදායම රු. 300 000 ක් වූ අතර ක්‍රීඩා සමාජයට ගෙවිය යුතු මුදල නිසි පරිදි ලැබී ඇත.

(v) 2012.12.01 දින 10% ක වාර්ෂික පොලියකට වසරක කාලයක් සඳහා ස්ථාවර තැන්පත් ගිණුම ආරම්භ කරන ලදී.

(vi) වර්ෂය තුළ දී දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් හෝ ඉවත් කිරීම් සිදු වී නොමැත.

**අවශ්‍යවන්නේ:**

(1) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම

(2) 2013.03.31 දිනට සමුච්චිත අරමුදල සහ මුදල් ශේෂය

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 15 යි)*

5. (අ) 2013 මාර්තු සහ පෙබරවාරි මාස සඳහා සීමිත අබ්දුල් පොදු සමාගමේ වැටුප් ලේඛනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | 2013 මාර්තු (රු. '000) | 2013 පෙබරවාරි (රු. '000) |
|---|---|---|
| මූලික වැටුප | 8 000 | 7 000 |
| අතිකාල දීමනා | 500 | 400 |
| සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකත්වය: | | |
| – සේවකයා (10%) | 800 | 700 |
| – සේව්‍යයා (15%) | 1 200 | 1 050 |
| සේවක භාරකාර අරමුදලට (ETF) දායකත්වය (3%) | 240 | 210 |
| අඩු කිරීම්: | | |
| – වෘත්තීය සමිතියේ සාමාජික ගාස්තු | 250 | 150 |
| – සේවක ණය ආපසු අය කිරීම් | 450 | 200 |

**අතිරේක තොරතුරු :**

(i) සෑම මසකම වැටුප ඊළඟ මාසයේ 10 වන දින ගෙවනු ලැබේ.

(ii) සෑම මසකම සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් දායකයන් ඊළඟ මාසයේ 15 වන දින ගෙවනු ලැබේ.

**අවශ්‍යවන්නේ:**

(1) 2013 මාර්තු මාසය සඳහා සමාගමේ සේවකයින්ට අදාළ මුළු වියදම (එක් එක් අයිතමයන් වෙන වෙන ම දක්වන්න.)

(2) 2013 මාර්තු මාසය සඳහා සමාගමේ වැටුප් පාලන ගිණුම, ගෙවිය යුතු වැටුප් ගිණුම සහ ගෙවිය යුතු EPF ගිණුම (ආරම්භක ශේෂයන් ද සහිත ව)

*(ලකුණු 05 යි)*

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

[6 වැනි පිටුව බලන්න.

(ආ) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මධුර පොදු සමාගමේ සහ සීමිත සුමුදු පොදු සමාගමේ සාරාංශගත ආදායම් ප්‍රකාශන පහත දී ඇත.

| | සීමිත මධුර පොදු සමාගම (රු. '000) | සීමිත සුමුදු පොදු සමාගම (රු. '000) |
|---|---|---|
| විකුණුම් | 6000 | 7500 |
| විකුණුම් පිරිවැය | (4000) | (5800) |
| දළ ලාභය | 2000 | 1700 |
| වියදම් | (1100) | (800) |
| බදු පෙර ලාභය | 900 | 900 |
| ආදායම් බදු | (300) | (300) |
| වර්ෂය සඳහා ලාභය | 600 | 600 |

2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ද දී ඇත.

| | සීමිත මධුර පොදු සමාගම (රු. '000) | සීමිත සුමුදු පොදු සමාගම (රු. '000) |
|---|---|---|
| සාමාන්‍ය තොගය | 1600 | 2900 |
| සාමාන්‍ය වෙළෙඳ ණයගැතියෝ | 2400 | 2500 |
| 2013.03.31 දිනට හිමිකම | 3000 | 2400 |
| 2013.03.31 දිනට දිගුකාලීන ණය | 3600 | 1800 |
| වියදම් තුළ ඇතුළත් ණය පොලී | 300 | 200 |

**අවශ්‍යවන්නේ:**

(1) සමාගම් දෙක සඳහා පහත දැක්වෙන අනුපාත:
- (i) හිමිකම් මත ඉපැයුම්
- (ii) පොලී ආවරණ
- (iii) තොග පිරිවැටුම්
- (iv) ණයගැති පිරිවැටුම් (සියලු ම විකුණුම් ණයට කළ බව උපකල්පනය කරන්න.)
- (v) ණය හිමිකම්

(2) ඉහත (1) හි කරන ලද ගණනය කිරීම් පදනම්ව, පහත දෑ හේතු සහිතව සඳහන් කරන්න.
- (i) අයිතිකරුවන් සඳහා වැඩි ඉපැයුමක් ජනනය කරන සමාගම
- (ii) වැඩිපුර ණය ප්‍රාග්ධනය භාවිත කරන සමාගම
- (iii) ණයගැතියන්ගෙන් මුදල් එකතු කිරීමට වැඩිපුර කාලයක් ගත කරනු ලබන සමාගම
- (iv) තොග විකිණීම සඳහා අඩු කාලයක් ගත කරනු ලබන සමාගම
- (v) ණය මත පොලී ගෙවීමට වැඩි හැකියාවක් ඇති සමාගම

*(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 15 යි)*

6. (අ) 2012.03.31 දිනට සීමිත නාදන් පොදු සමාගමේ දේපල, පිරියත සහ උපකරණ සඳහා පහත තොරතුරු අදාළ වේ.

| වත්කම | පිරිවැය (රු. '000) | ධාරණ වටිනාකම (රු. '000) | සුන්බුන් අගය (රු. '000) | ඵලදායී ජීව කාලය (වසර) |
|---|---|---|---|---|
| ඉඩම් | 3500 | 3000 | - | - |
| ගොඩනැගිල්ල | 2500 | 1000 | - | 25 |
| මෝටර් රථය | 5000 | 3200 | 500 | 5 |
| කාර්යාල උපකරණ | 500 | 400 | 100 | 4 |

මෙදිනට සමාගම සතු වූයේ එක ම මෝටර් රථයකි. වත්කම් පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. 2012.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ඉඩම් ප්‍රත්‍යාගණන අලාභය රු. 500 000 ක් විය.

2013.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී මෙම වත්කම්වලට අදාළව පහත ගනුදෙනු සිදු විය.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2012.04.01 | රු. 1 250 000 ක් වැය කරමින් ගොඩනැගිල්ල පුළුල් කරන ලදී. එම නිසා ගොඩනැගිල්ලේ ඉතිරි ඵලදායී ජීවකාලය වසර 10 සිට 15 ක් දක්වා වැඩි වී ඇත. |
| 2012.10.01 | මෝටර් රථය රු. 3 000 000 කට විකුණන ලද අතර නව මෝටර් රථයක් රු. 4 000 000 කට මිල දී ගන්නා ලදී. නව මෝටර් රථයේ අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 6 ක් වන අතර සුන්බුන් අගය රු. 400 000 කි. |
| 2013.01.01 | කාර්යාලීය උපකරණ අළුත්වැඩියා කිරීමට රු. 50 000 ක් වැය කරන ලදී. |
| 2013.03.31 | ඉඩම රු. 4 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. |

ඉහත ගනුදෙනු ගැලපීමට පෙර 2013.03.31 දිනට ව්‍යාපාරයේ හිමිකම රු. 1 000 000 ක් විය.

**අවශ්‍යවන්නේ:**

(1) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එක් එක් දේපල, පිරියත සහ උපකරණ අයිතමය මත ක්ෂය ගණනය කිරීම

(2) ඉහත ගනුදෙනු ගැලපීමෙන් පසු 2013.03.31 දිනට සමාගමේ හිමිකම ගණනය කිරීම

*(ලකුණු 05 යි)*

[ 7 වැනි පිටුව බලන්න.

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform

(ආ) සීමිත කුමුදු පොදු සමාගමේ සාරාංශගත මූල්‍ය ප්‍රකාශන පහත දී ඇත.

**සීමිත කුමුදු පොදු සමාගම**

**2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය**

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| විකුණුම් | | 7200 |
| විකුණුම් පිරිවැය | | (4200) |
| දළ ලාභය | | 3000 |
| ඉඩම් විකිණීමේ ලාභය | | 300 |
| ක්ෂය - ගොඩනැගිලි | 500 | |
| - කාර්යාල උපකරණ | 800 | |
| අනෙකුත් වියදම් | 1000 | (2300) |
| බදු පෙර ලාභය | | 1000 |
| ආදායම් බදු | | (300) |
| වර්ෂය සඳහා ලාභය | | **700** |

**සීමිත කුමුදු පොදු සමාගම**

**මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ශේෂ පත්‍රය)**

| | 2013 (රු. '000) | 2012 (රු. '000) |
|---|---|---|
| ඉඩම් | 5000 | 9000 |
| ගොඩනැගිලි - පිරිවැයට | 10000 | 10000 |
| සමුච්චිත ක්ෂය - ගොඩනැගිලි | (5000) | (4500) |
| කාර්යාලීය උපකරණ - පිරිවැයට | 8000 | 4000 |
| සමුච්චිත ක්ෂය - කාර්යාලීය උපකරණ | (2400) | (1600) |
| තොගය | 1400 | 1000 |
| වෙළෙඳ ණයගැතියෝ | 1500 | 1200 |
| බැංකුවේ ඇති මුදල් | 1500 | 500 |
| | **20000** | **19600** |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 14000 | 13000 |
| රඳවාගත් ඉපැයුම් | 4200 | 4000 |
| වෙළෙඳ ණයහිමියෝ | 1500 | 2000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 300 | 600 |
| | **20000** | **19600** |

**අතිරේක තොරතුරු :**

(i) සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත වේ.

(ii) සමාගම 2012.04.01 දින සාමාන්‍ය කොටස් 10000 ක් රු. 1000000 කට නිකුත් කර ඇත.

(iii) ඉඩමෙන් කොටසක් රු. 4300000 කට අත්පිට මුදලට විකුණා ඇත.

(iv) 2013.03.31 දින රු. 4000000 ක් වූ කාර්යාල උපකරණ අත්පිට මුදලට මිල දී ගෙන ඇත.

(v) වර්ෂය තුළදී රු. 500000 ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

**අවශ්‍යවන්නේ:**

අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත කුමුදු පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.

*(ලකුණු 10 යි)*

***(මුළු ලකුණු 15 යි)***

paperhub.lk

7. (අ) 2013 ජූනි මාසය සඳහා නිෂ්පාදන සමාගමක ණයගැති ලේජරයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී. (සියලුම වටිනාකම් රු.'000 වලින් දී ඇත.)

| ණයගැතියා | 2013.06.01 දිනට ශේෂය | විකුණුම් | මුදල් ලැබීම් | දුන් වට්ටම් | බොල් ණය | 2013.06.30 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| අජිත් | 300 | 1400 | 1000 | 140 | - | 560 |
| දයාන් | 200 | 300 | 200 | 30 | - | 270 |
| මලිත්ත | - | 100 | - | - | 40 | 60 |
| කමල් | 100 | 100 | - | - | 20 | 180 |
| | **600** | **1900** | **1200** | **170** | **60** | **1070** |

2013.06.30 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය සහ ණයගැති ලේජර් ශේෂවල එකතුව සමාන නොවීය. පසුව කරන ලද විමර්ශනවලින් පහත වැරදි හෙළිදරව් විය.

(i) මාසයේ විකුණුම් ණයගැති පාලන ගිණුමේ සටහන් කර ඇත්තේ රු. 1 090 000 ක් ලෙස ය. නමුත් එය නිවැරදිව විකුණුම් ගිණුමේ සටහන් කර ඇත.

(ii) යන්ත්‍රයක් රු. 600 000 කට ණයට විකිණීම ණයගැති පාලන ගිණුමේ විකුණුම් ලෙස සටහන් කර ඇත.

(iii) මාසය තුළ දී කපා හල බොල්ණය ණයගැති පාලන ගිණුමේ සටහන් කර නොමැත. ඒ වෙනුවට ඒවා අඩමාණ ණය සඳහා වෙන් කිරීමේ ගිණුමට බැර කර ඇත.

(iv) ණයගැතියන්ට දුන් වට්ටම් ණයගැති පාලන ගිණුමට හර කර ඇත. නමුත් එය දුන් වට්ටම් ගිණුමේ නිවැරදිව සටහන් කර ඇත.

**අවශ්‍යවන්නේ:**

(1) 2013.06.30 දිනට ණයගැති ලේජරයේ සහ ණයගැති පාලන ගිණුමේ ශේෂ සැසඳීමේ ප්‍රකාශනය

(2) ඉහත (i) සහ (iv) හි ඇති වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් (සංලක්ෂ්‍ය අවශ්‍ය වේ.)

*(ලකුණු 05 යි)*

(ආ) සමාගමක් විසින් එහි නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට නව යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. මේ සම්බන්ධයෙන් පහත තොරතුරු ලබා දී ඇත.

(i) **යන්ත්‍රයට අදාළ තොරතුරු:**

| | |
|---|---|
| පිරිවැය | රු. 1 000 000 |
| ඵලදායී ජීව කාලය | වසර 5 යි |
| සුන්බුන් අගය | රු. 100 000 |
| වාර්ෂික නඩත්තු පිරිවැය | රු. 50 000 |

(ii) නව යන්ත්‍රය භාවිතයෙන් වාර්ෂිකව සෘජු ශ්‍රම පිරිවැයෙන් රු. 250 000 ක් ඉතිරි කළ හැක.

(iii) නව යන්ත්‍රය මිල දී ගතහොත් පැරණි යන්ත්‍රය රු. 150 000 කට විකිණිය හැක.

(iv) 10% අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක:

| වසර | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |

**අවශ්‍යවන්නේ:**

ඉහත ව්‍යාපෘතියට අදාළව:

(1) එක් එක් වර්ෂය සඳහා මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම්

(2) පිළිගෙවුම් කාලය

(3) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (ආරම්භක ආයෝජනය මත)

(4) ශුද්ධ වර්තමාන අගය

(5) ශුද්ධ වර්තමාන අගය පදනම්ව යන්ත්‍රය මිල දී ගැනීම සුදුසු දැයි යන නිර්දේශය

*(ලකුණු 10*

*(මුළු ලකුණු 15*

* * *

PaperHub.LK - Sri Lanka's Largest Exam Papers Platform